# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

## කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
# ලංසු සඳහා ආරාධනයයි
## ජාතික තරගකාරී ලංසුකරණය
### EDB/PU/NCB/2025/06

# කාර්ය මණ්ඩල ප්‍රවාහනය - 2026

01. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පහත සඳහන් මාර්ගයන් හි වසරක කාලයක් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට (ප්‍රධාන කාර්යාලය) වායුසමනය කළ හෝ නොකළ බස් රථ /වෑන් රථ මගින් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා මගී ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | බස් මාර්ගය | ආරම්භක ස්ථානය |
|---|---|---|
| 01. | කළුතර නව ගාලුපාර නවම් මාවත | කළුතර නගරය |
| 02. | ඉහළ බෝමිරිය කඩුවෙල හරහා නවම් මාවත (ලෝලෙවල් පාර) | ඉහළ බෝමිරිය හංදිය |
| 03. | පාදුක්ක ගොඩගම හරහා නවම් මාවත | පාදුක්ක |
| 04. | හෝමාගම හයිලෙවල් පාර හරහා නවම් මාවත | හෝමාගම නගරය |
| 05. | කොටුගොඩ ජා ඇල පාර හරහා නවම් මාවත | කොටුගොඩ හංදිය |
| 06. | ගුරුගොඩ, හොරණ, බණ්ඩාරගම හරහා නවම් මාවත (නවම් මාවතේ සිට උපරිම 50km දක්වා) | ගුරුගොඩ |
| 07. | තිත්වැල් මංකඩ,පස්යාල හන්දිය නුවර පාර හරහා නවම් මාවත (නවම් මාවතේ සිට උපරිම 50km දක්වා) | තිත්වැල් මංකඩ |

02. ලංසු භාර ගැනීමේ අවසාන දින සිට ලිත් දින 77 ක් ලංසු වලංගු විය යුතුය.

03. අපනයන සංවර්ධන මණ්ඩලයේ **www.srilankabusiness.com** වෙබ් අඩවියේ "Announcement" යටතේ ආදර්ශ ලංසු ලේඛන කට්ටලය බාගත කළ හැක.

04. ආපසු නොගෙවන රු. 2000/- ක ගාස්තුවක් හා ආපසු ගෙවනු ලබන රු. 5000/- ක තැන්පතුවක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය නමින් ලංකා බැංකුවේ ලේක්විව් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක - 306605 ගිණුමට බැර කර ලබාගත් බැංකු ලදුපත හෝ රිසිට්පත ලංසු ලිපිලේඛන සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. (බැංකු ලදුපත හෝ රිසිට්පතහි මුල් පිටපත අමුණා නොමැති ලංසු වලංගු ලංසුවක් ලෙස පිළිගනු නොලැබේ.)

05. මුද්‍රා තබන ලද ලංසු, බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"කාර්ය මණ්ඩල ප්‍රවාහනය - 2026"** ලෙස සඳහන් කර 2025/12/09 වන දින පෙ.ව. 10.00ට හෝ ඊට පෙර ලැබෙන පරිදි **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ප්‍රසම්පාදන ඒකකය, 6 වන මහල, NDB - EDB කුළුන, අංක 42, නවම් මාවත, කොළඹ 02."** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ 6 වන මහලේ ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ලංසු භාර ගැනීම අවසන් වූ පසුව පෙ.ව 10.30 ටලංසු විවෘත කරනු ලැබේ.

06. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවෙන් පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

07. ලංසු සඳහා ඉදිරිපත් කරන බස් රථ/ වෑන් රථ මූලික තත්ව පරීක්ෂාවකට ලක් කෙරේ. ඒ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නියම කරන ලද දිනයේ අදාළ වේලාවට ලංසුව ඉදිරිපත් කළ වාහනය ඊට අදාළ ලියකියවිලි සමග රැගෙන ආයුතුවේ.

08. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගී වීමට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට අවසර දෙනු ලැබේ.

09. වැඩිදුර තොරතුරු සඳහා දුරකථන අංක : 0112300702 ඔස්සේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රසම්පාදන ඒකකයේ සහකාර අධ්‍යක්ෂිකා කේ. දිස්නා ප්‍රියංගිකා මහත්මිය අමතන්න.


**සභාපති, ප්‍රධාන විධායක නිලධාරී,**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB - EDB කුළුන, නො: 42, නවම් මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව.**

**දුරකථනය : +94112300700**

**වෙබ් අඩවිය : https://www.srilankabusiness.com**